විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.


අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2010 දිනය / திகதி / Date 2010- 09- 27

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 4/2010 (1)**

සියළුම දූත මණ්ඩල ප්‍රධානීන්,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## <u>රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල</u>
## <u>උපදෙස් මාලාව</u>

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 4/2010 මගින් පහත කරුණු සම්බන්ධයෙන් ලබා දෙන ලද උපදෙස් වලට අමතර වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

**01. සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් නොලබන නිලධාරීන් (4/2010 චක්‍රලේඛයේ 4 ඡේදය) (රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීම ගරු අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලයේ තනතුරු)**

1.1. උක්ත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි පහත සඳහන් නිලධාරීන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් නොලබන අතර එවැනි නිලධාරීන්ගෙන් දායක මුදල් අයකිරීම අවශ්‍ය නොවේ.

I. විශ්‍රාමික රජයේ නිලධාරීන් ගරු අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලයේ සේවයට යොදවාගන්නා අවස්ථාවන්හිදී,

II. වයස අවු. 60 ඉක්මවූ නිලධාරීන්

III. " ට" උපලේඛණයට අයත් ගරු අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් එම තනතුරු වල අවම වශයෙන් වසර 05 ක සේවා කාලයක් සපුරා විශ්‍රාම වැටුපකට හිමිකම් ලබා ඇති විට, යලිත් ගරු අමාත්‍ය කාර්ය මණ්ඩල සේවයේ පිහිටුවා ඇති විට


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

1.2. ඉහත කාර්ය මණ්ඩලවල නිලධාරීන් සාමාජිකත්වය ලබාගැනීම සඳහා අයදුම්පත්‍ර එවීමේදී කරුණු නිසි පරිදි සඳහන් නොකිරීම නිසා අංක ලබාදීමේදී මේ පිළිබඳව නැවත නැවත විමසීමට සිදුවන අතර, සමහර අවස්ථාවන්හිදී සාමාජිකත්වය ලබාගෙන දායක මුදල් අය කරන අවස්ථාවන්ද දක්නට ලැබේ.

1.3. එමෙන්ම ඉහත තනතුරු දරන නිලධාරියෙක් රා.සේ.අ.අ. සාමාජිකත්වය අහෝසිවීම මත ප්‍රදානයක් ලබාගතහොත් ඔහුගේ/ඇයගේ සාමාජිකත්වය අහෝසි වන අතර ඔහු /ඇය නැවත සේවයේ යෙදෙන්නේ නම් නව සාමාජික අංකයක් ලබා ගත යුතුය.

1.4. එබැවින් සාමාජිකත්වය ලබා දීමේදී මෙන්ම දායක මුදල් අයකිරීමේදී ද ඔබ අමාත්‍යාංශයේ නිර්දේශිත අයදුම්පත්‍ර මත කටයුතු කරන බැවින් මේ පිළිබඳව අවධානය යොමු කර ඉල්ලුම්පත්‍ර නිර්දේශ කරන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කළ යුතුය.

## 02. දායක මුදල් එවිය යුතු ආකාරය
(4/ 2010 චක්‍රලේඛයෙහි 8 (I) හා (II) ඡේද)

මින් ඉදිරියට දායක මුදල් මාසිකව චෙක්පත් මඟින් පමණක් එවිය යුතු බව ඉහත චක්‍රලේඛය මඟින් උපදෙස් නිකුත් කර ඇති බැවින් පත්වීම් බලධාරීන් අවශ්‍ය ප්‍රතිපාදන රාජ්‍ය අයවැය හෝ වෙනත් මූලාශ්‍ර වලින් සපයා ගන්නා ලෙස නැවත වරක් දන්වා සිටිමි.

## 03. සාමාජිකත්ව අංක ලබා ගැනීම

3.1 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පත්වීම් ලාභීන්ගෙන් දායක මුදල් අයකර සාමාජික අංක ලැබෙන තෙක් දෙපාර්තමේන්තුවල විවිධ තැන්පත් ගිණුමේ රඳවාගෙන සිටින බව මා වෙත වාර්තා වී ඇත. සාමාජික අංක ලැබෙන තෙක් දායක මුදල් එලෙස රඳවාගෙන තබා ගැනීම අවශ්‍ය නොවන අතර, එලෙස සාමාජිකත්වය ලබා ගෙන නොමැති දායකයින්ගේ නම්ද "දායකයින්ගේ මාසික ලැයිස්තුවේ" සඳහන් කර චෙක්පත සමඟ එවිය යුතු අතර, ඒ සමඟම සාමාජිකත්වය ලබා ගැනීම සඳහා PD 1 (N) සහ PD 2 (N) අයදුම්පත්‍ර එවිය යුතුය. නවක නිලධාරීන් එලෙස පත්වීම් ලබාගත් මාසය තුළදී ඔවුන්ගේ නම පමණක් ලැයිස්තුවේ සටහන් කිරීම ප්‍රමාණවත් වන අතර, සාමාජික අංක ලැබුණ පසු ඉදිරි මාසයේ සිට සාමාජික අංක සඳහන් කර එවිය යුතුය.

3.2 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සහිත පත්වීම් ලබාගත් නවක නිලධාරීන් එලෙස පත්වීම් ලබා ගත් මාසය තුළදීම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලස්වාදීම ගණන්දීමේ හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වන්නේය.

04. ඉහත චක්‍රලේඛ **www.pensions.gov.lk** වෙබ් අඩවිය තුලින් ලබා ගත හැකිය.

කේ.ඒ.තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා අර්ථසාධක
අරමුදල් කළමණාකරණ මණ්ඩලයේ සභාපති

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති